“ඔබ අතරින් කිසිවකු හෝ ඈනුම් හැරිය විට, ඔහු තම අත තම කට මත තබා වළක්වා ගත යුතුයි. මක්නිසාදයත් ෂෙයිතාන් පිවිසෙන බැවිනි

අල්ලාහ්ගේ දූතයාණන් (සල්ලල්ලාහු අලයිහි වසල්ලම්) ප්රකාශ කළ බව අබූ සඊද් අල් කුද්රී (රළියල්ලාහු අන්හු) තුමා විසින් මෙසේ වාර්තා කරන ලදී: “ඔබ අතරින් කිසිවකු හෝ
ඈනුම් හැරිය විට, ඔහු තම අත තම කට මත තබා වළක්වා ගත යුතුයි. මක්නිසාදයත් ෂෙයිතාන් පිවිසෙන බැවිනි."
[صحيح] [رواه مسلم]

මැලිකමින් හෝ පිරුණ බවින් හෝ එවැනි වෙනත් හේතුවකින් හෝ තම කට විවෘත කරමින් ඈණුම් හරින්නාට ඔහුගේ කට මත ඔහුගේ අත තබා එය වසා ගන්නා මෙන් නබි (සල්ලල්ලාහු අලයිහි වසල්ලම්) තුමාණෝ මඟ පෙන්වූහ. එසේ කිරීම අත්හැරිය විට සැබැවින්ම ෂෙයිතාන් එහි පිවිසෙනු ඇත. එබැවින් ඔහු එහි පිවිසීම වළක්වාලමින් ඒ මත අත තැබිය යුතුය.

http://www.sunnah.global/hadeeth/si/show/5280